# ලොව පුරා ශාන්තිය පැතිරවූ මුහම්මද් නබි තුමාණෝ

**ලොව පුරා ජීවත් වන කෝටි සංඛ්‍යාත මුස්ලිම් ජනතාව පිළිපදිනු ලබන ඉස්ලාම් ධර්මය මෙලොව පරිපූර්ණ කර දුන් වක්තෘවරයාණන් වන මුහම්මද් නබි තුමන්ගේ ජන්ම දිනය හෙටට (09) යෙදී තිබේ. මුහම්මද් නබි තුමන්ගේ ජන්ම දිනය යෙදී ඇති හෙට දිනයේදී මුස්ලිම් ජනතාව විවිධ ආගමික වැඩසටහන්වලට එක්වීමද සිදුවේ. ඒ නිමිත්තෙන් පහත ලිපිය පළවේ.**

**ඉස්ලාම් ධර්මය පරිපූර්ණ කරනු ලැබුවේ මුහම්මද් නබි තුමාණන් වුවද ඉස්ලාම් ධර්මය ලොව බිහි වූයේ ඉස්ලාමීය විශ්වාසවලට අනුව ලොව මුල්ම මිනිසා වූ ආදම් නබි තුමාගෙනි. මුස්ලිම්වරු විශ්වාස කරන අල්ලාහ් දෙවියන් වහන්සේගේ ලොව මුල්ම මිනිසා ලෙස ආදම් තුමන් මෙලොවට බිහි කරනු ලැබුවේ නබිවරයකු ලෙස වීමත් ඉස්ලාමය තුළ පවතින සුවිශේෂත්වයකි. ආදම් තුමන්ගේ ඉල ඇටවලින් හව්වා තුමියා මවා මෙලොව මානව ව්‍යාප්තිය දෙවියන් වහන්සේ විසින් ස්ථාපිත කළ බවද ඉස්ලාමයේ සඳහන් වෙයි. නබි ආදම් තුමන්ගෙන් පටන් ගෙන මුහම්මද් නබි තුමන් දක්වා ඒ ඒ කාලවල පැවැති සමාජය යහමඟට ගැනීම සඳහා වක්තෘවරුන් එක් ලක්ෂ විසි හතර දහසක් පැමිණි බව ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වෙයි.**

එලෙස පැමිණි වක්තෘවරුන් එක් ලක්ෂ විසි හතර දහසක් අතුරින් විසි පස් දෙනෙකුගේ නම් ශුද්ධ වූ කුරාණයේ සඳහන් වෙයි. ඒ අතර අවසන් වක්තෘවරයාණන් වන්නේ මුහම්මද් නබිතුමාණන්ය.

ලොව පළමු මිනිසා ලෙස ආදම් නබි තුමන් බිහි වූ ද පටන් වක්තෘවරුන් එක් ලක්ෂ විසි හතර දහසක් මෙලොවට පැමිණ තිබුණ ද අවසන් නබිවරයාණන් ලෙස මුහම්මද් තුමාණන් මෙලොවට බිහි වන විට අරාබිකරයේ ජීවත් වූ මිනිස්සු ම්ලේච්ඡත්වය කර පින්නා ගත් සමූහයක් වූහ. කලින් කල නබිවරුන් සහ වක්තෘවරුන් පැමිණ තිබුණ ඔවුන්ගෙන් වැඩි දෙනෙකු රටකට, සමාජයකට හෝ පළාතකට පමණක් සීමා වීම නිසා ඔවුන්ට ඒ කාර්යය නිසි ලෙස ඉටු කරන්නට නොහැකි වූ බවත් මුහම්මද් නබි තුමාණන්ගෙන් ඉස්ලාමය පරිපූර්ණ කරන බවත් ඉස්ලාමය කියයි.

මුහම්මද් නබි තුමාණන් මෙලොව එළිය දකින්නේ ක්‍රිස්තු වර්ෂ 570වසරේදී වත්මන් සෞදි අරාබියේ මක්කා නගරයේදීය. එකල එහි වංශවත් ගෝත්‍රයක් වූ කුරෙෂි ගෝත්‍රයේය. නබිතුමාණන්ගේ පියාණන් වනුයේ අබ්දුල්ලා තුමන් වන අතර පියා නබිතුමන් ඉපදීමටත් පෙර මෙලොව හැර ගිය අතර මවු තුමිය වූ ආමිනා තුමිය නබි තුමගේ වයස අවුරුදු හයේදී මෙලොව හැර ගියාය. එතැන් පටන් සිය මුත්තණුවන් වූ අබු තාලිබ් තුමා ළඟ කුඩා මුහම්මද් හැදී වැඩෙන්ට විය. නබි තුමාණෝ සිය කුඩා කාලයේ පටන්ම එළුවන් බැලීමේ එඬේර ජීවිතයක් ගත කළ අතර පසුව මක්කාවේ සිට අසල්වැසි රටවලට ගොස් ගැල් වෙළඳාමේ යෙදුණාහ. වෙළෙඳ කටයුතුවල දී ශූරත්වයක් පෙන්නූ තරුණ මුහම්මද් කුමරා සිය 25 වැනි වියේදී තමන්ට වඩා වයසින් අවුරුදු 15 ක් වැඩිමහල් වූ කදීජා තුමිය සමඟ විවාහ වූයේය. වෙළෙඳ කටයුතුවලදී එතුමා තුළ තිබූ අවංක භාවය සහ විශ්වාසවන්තකම නිසාම එතුමන් හට අල් අමීන් යන නම ද එකල පට බැඳ තිබිණ. එහි තේරුම වන්නේ 'විශ්වාසන්තයා' යන්නයි.



ඡායාරූපය: අන්තර්ජාලයෙනි

මෙම කාලයේ මුහම්මද් තුමාණන්ගේ ජීවිතයේ යම් යම් වෙනස්කම් සිදු වන බව කදීජා තුමිය නිරන්තරයෙන් දැක තිබූ අතර එය කුමක් හෝ අසනීපයක් දැයි ඇය අසා ඇති වාර බොහෝය.

සිය තරුණ කාලයේදීම මක්කා නගරයට තරමක දුරින් කඳුවළල්ලෙන් වටව පිහිටා ඇති හිරා නම් ගුහාවකට ගොස් තනිවම යාඥා කිරීම නබි තුමන්ගේ ජීවිතයේ කොටසක් බවට පත්ව තිබිණ. මිනිස් වාසයකින් තොර පාළු වී ගිය එම ගුහාවට වී දෙවියන් ගැනත් දෙවියන්ගේ මැවීම් ගැනත් නිරන්තරයෙන් මෙනෙහි කිරීම මුහම්මද් තුමාණන්ගේ පුරුද්ද වී තිබිණ. මෙලෙස යාඥාවේ නියැළී සිටිය දී එක් දිනයක ජිබ්රීල් නම් වන දේව දූතයාණන් එම ස්ථානයට පැමිණ මුහම්මද් තුමා ඉදිරියේ පෙනී සිටිමුහම්මද් කියවන්න යැයි කීය. කිසිඳු අධ්‍යාපනයක් ලබා නොසිටි මුහම්මද් තුමාණෝ 'මා කෙසේ කියන්නද මම කිසිවක් ඉගෙන ගෙන නෑනේ' යැයි කීහ. එවිට දේව දූතයා 'දෙවියන්ගේ නාමයෙන් කියන්න යැයි' නැවතත් කීය. එවිට මුහම්මද් තුමාණෝ දේව දූතයාණන් කී පරිදි කීහ. ශුද්ධ වූ අල් කුරාණය බිහි වීම එලෙස ආරම්භ වූ අතර එය මෙලොවට පහළ වූ ශුද්ධ වූ කුරාණයේ මුල්ම වැකියයි. (ඉක්රහ් නමින් ආරම්භ වේ)

මෙම සිද්ධියෙන් බියට පත්ව ඉක්මනින් නිවසට දිව ගිය මුහම්මද් තුමාණෝ සිය භාර්යාව වූ කදීජා තුමියට මේ ආශ්චර්යය ගැන කීහ. ඇය තම ඥාතියෙකු වන වයෝවෘද්ධ විද්වතෙකු වෙත මුහම්මද් තුමන් කැඳවාගෙන ගොස් සිදු වූ සියල්ල ප්‍රකාශ කර සිදු වී ඇත්තේ කුමක්දැයි විමසා සිටියාය. ඉපැරැණි ආගම් ගැන හොඳ දැනුමකින් සහ අවබෝධයකින් යුත් එම වයෝවෘද්ධ විද්වතා ඔබ වෙත පැමිණ ඇත්තේ ජිබ්රීල් නම් දේවදූතයා බවත් දෙවියන් වහන්සේ ඔබව වක්තෘවරයකු (නබිවරයකු) වශයෙන් පිළිගෙන ඇති බවත් කීය.

මුහම්මද් තුමාණන්ගේ ජීවිතයේ 40 වන වියේදී සිදු වූ මෙම සිදුවීම සිදුවූ ද පටන් එතුමන් මෙලොව හැර යන 63 වැනි විය දක්වා වූ වසර 23 ක කාලයක් සිය ආගමික මෙහෙය ඉටු කළේය. අනේකවිධ දුක්ඛ දෝමනස්සවලට මුහුණ දුන් එම කාලය තුළ ම්ලේච්ඡත්වයෙන් පිරී තිබූ අරාබිකරයේ සමාජ ක්‍රමය යහපත් සමාජ ක්‍රමයක් ලෙස නිර්මාණය කිරීමට සමත් විය. ලොව පුරා වෙසෙන සියලු ජනතාව අතර සාමයේ පණිවිඩය රැගෙන ගියේය. ඉස්ලාම් ධර්මය අරාබිකරය තුළ ප්‍රචලිත කිරීමේ දී සිය පවුලේම ඥාතීන් වන පිරිසක් ඇතුළු කණ්ඩායමක් නබි තුමාට එරෙහි වූ අතර විවිධ තාඩන පීඩන ද ඇති විය. ඒ වන විටත් ඉස්ලාමය පිළිගත් පිරිස ඉතා අල්ප වුවද දෙවියන් වහන්සේගේ උපකාරය නිරන්තරයෙන් එතුමන්ට ලැබිණ. එසේ සිටිය දී දෙවියන්ගේම දැනුම් දීමක් අනුව නබිතුමා ඇතුළු පිරිස මක්කාව හැර මදීනාව බලා පිටත්ව යාමට කටයුතු කළ අතර එය හිජ්රත් ගමන ලෙස සඳහන් වෙයි. ඉස්ලාමීය වර්ෂ ක්‍රමය ආරම්භ වන්නේ මෙතැන් සිට වන අතර එම ගමන ඉස්ලාමීය ඉතිහාසයේ විශේෂ සන්ධිස්ථානයක්ද වෙයි.

අල්ලාහ් දෙවියන් වහන්සේ මුහම්මද් නබි තුමාණන් මගින් මෙලොව පරිපූර්ණත්වයට පත් කළ ධර්මය මෙම ඉස්ලාම් ධර්මය වෙයි. ඉස්ලාම් ධර්මය ඇදහීම ඕනෑම මුස්ලිම්වරයෙකුට ඉතාම සරලව සිදු කළ හැකිය. ඉස්ලාමයේ අනිවාර්ය වගකීම් පහක් සඳහන් වන අතර එයින් දෙකක් යමක් කමක් ඇති පිරිසට සීමා වෙයි. අනෙක් වගකීම් තුන සියලු දෙනාට අනිවාර්ය වෙයි. මෙම වග කීම් පහෙන් පළමු වැන්න අල්ලාහ් දෙවියන් වහන්සේ සහ මුහම්මද් නබිතුමන් ගැන විශ්වාස කිරීමයි. පස්වේල් සලාතය ඉටු කිරීම, රමළාන් මාසයේ උපවාසය රැකීම, සියයට දෙක හමාරක දුගී බද්ද ගෙවීම සහ හජ් වන්දනය ඉටු කිරීම එම වගකීම් පහයි. මෙම වගකීම්වලින් දුගී බද්ද ගෙවීම සහ හජ් වන්දනය කිරීම සඳහා මක්කමට යාම ඒ සඳහා ප්‍රමාණවත් ධනය ඇති අයට පමණක් සීමා වෙයි. අල්ලාහ් දෙවියන් වහන්සේ සහ මුහම්මද් නබිතුමා විශ්වාස කිරීම, පස් වේල් සලාතය ඉටු කිරීම සහ රමළාන් මාසයේදී උපවාසය රැකීම සියලු දෙනාටම අනිවාර්ය වන අතර අසනීප තත්ත්වය මත ඒ සඳහා ද සහන ලබා දී තිබේ.

ලොව පුරා ජීවත් වන මුස්ලිම් බැතිමතුන්ගේ ජීවිතය හැඩ ගැසී ඇත්තේ ශුද්ධ කුරාණය මගින් දෙවියන් වහන්සේ විසින් ලබා දුන් මාර්ගෝපදේශ සහ නබි මුහම්මද් තුමාණන්ගේ ජීවිතය අනුවයි. මෙලෙව මිනිසකු උපන් දසිට මිය යන තුරුම ජීවත් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව නබි තුමාණෝ සිය ජීවිතය තුළින් ජීවත් වී පෙන්වා දුන්හ. ඉතා කුඩා දිළිඳු නිවසක ජීවත් වූ එතුමන් දුගී ජනතාවට දන් දීමේදී තමන්ගේ ආහාරයට තිබූ රොටී කබැල්ල බඩගිනියි කියා පැමිණෙන වෙනත් පුද්ගලයෙකුට ලබා දී නිරාහාරව සිටියහ. ඉතාමත්ම දුප්පත් ජීවිතයක් නබි තුමන් ගත කළේය. එවන් දුෂ්කර ජීවිතයක් ගත කළ නබි තුමාණෝ අද ලොව දෙවන විශාලම ධර්මය බවට පත්ව ඇති ඉස්ලාම් ධර්මය පරිපූර්ණ කර ලොවට දායාද කළහ. නබි තුමාණෝ දේශනා එක් ජාතියකට රටකට හෝ දේශයකට පමණක් සීමා වූවක් නොවේ. ලොව ඕනෑම තැනක ජීවත් වන මිනිසුනට ඉස්ලාම් දහම මනාව පිළිපැදිය හැකි ආකාරයේ දේශනා මෙන්ම නීති රීතිද එහි දැක්වෙයි. ඉස්ලාම් ධර්මය ලොව පුරා ශාන්තිය සහ සාමය ඇති කිරීම සඳහා වෙහෙසුන සහ වෙහෙසෙන දහමකි. තමන්ගේ සාමය වෙනුවෙන් ඇති කර ගනු ලැබූ ගිවිසුම් මගින් තමන්ගේ අයිතිවාසිකම් අත් හැර ගැනීමට පවා නබි තුමාණෝ පියවර ගත්හ.

සටහන- **මොහොමඩ් ආසික්**